# විදේශ විනිමය දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

# 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 03 දරන විධානයන්

---

## ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වැනි වගන්තිය ප්‍රකාරව, 2017 අංක 09 දරන 2017 නොවැම්බර් 20 දිනැති ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් පිළිබඳ නිකුත් කරන ලද විධානයන්හි (5) පරිච්ඡේදය අවලංගු වී පහත සඳහන් ආකාරයට වහාම ක්‍රියාත්මක වන පරිදි ආදේශ වන බව බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් දන්වා සිටිමු.

(5) (I) අවශ්‍ය වූ විටකදී, අවසාන පිළියම වශයෙන්, එලෙස විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර අය කර ගැනීම සිදු කළයුතුය. මේ සඳහා අදාළ ණය ගිවිසුමෙහි එකඟ වූ පරිදි විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියා (එනම් ණය ගැණුම්කරු) තම සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ණය මුදල සම්පූර්ණයෙන් ගෙවීමට විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහයක් නොලබන බවට බලයලත් වෙළෙන්දා තෘප්තිමත් වියයුතු අතර ඒ සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි පවත්වා ගත යුතුය.

(II) ඉහත 5(අ) ට අනුගතවීමේදී, මහ බැංකු අධිපතිවරයා විසින් 2020 මාර්තු 27 දින සියළුම බලයලත් වෙළෙඳුන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත, කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා තනි පුද්ගලයන් වෙත පහසුකම් සැපයීම සඳහා ගනු ලැබූ අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ග සඳහන් කරමින් නිකුත් කරන ලද "ණය හා අත්තිකාරම් වර්ගීකරණය සහ විදේශ ව්‍යවහාර මුදල් ණය නැවත අය කර ගැනීම පිළිබඳ ලිහිල් කිරීම්" ලිපියේ සඳහන් විස්තර පිළිබඳව ද අවධානය යොමු කළයුතුය.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

2020 අප්‍රේල් 03 දින